# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,470 - 2026 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2026.01.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 02 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

2026 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මීනුවන්ගොඩ දිසා අධිකරණයේ දී ය

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

කොළඹ 01, සර් රසීක් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයේ, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. සහ දිවුලපිටිය සර්ක්‍යුලර් පාර, අංක 15 දරන ස්ථානයේ "දිවුලපිටිය ශාඛාව" යනුවෙන් සඳහන් කරන හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ / හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේ ය.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 35/MB |
| වටිනාකම | : | රු. 965,661/- |
| ස්වභාවය | : | උකස් |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍යය |
| ඇස්කිසි අංකය | : | 78/25 |

...............*පැමිණිලිකරු.*

*- එදිරිව -*

(1) ජයසේකර හෙට්ටි ආරච්චිගේ පසන් චමින්ද ජයසේකර, මාහේන වත්ත, හොරගස්මුල්ල, දිවුලපිටිය.

(2) ජයවීර ආරච්චිගේ ඉමාලි මංගලා, මාහේන වත්ත, හොරගස්මුල්ල, දිවුලපිටිය.

............*විත්තිකරුවන්.*

වර්ෂ 2019 ක් වූ මාර්තු මස 22 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

(*අ*) ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති රු. 720,000/- ක් සහ රු. 65,660/91 ක් ලෙස සමස්ථය රු. 785,660.91 ක මුදලක් සහ එකී රු. 720,000/- ක් වූ එකී මුදල මත 2015.12.25 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් ආගණනය කරන ලද වර්ෂයකට 10% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද සමග අයකර ගැනීම සඳහා 1 වන හා 2 වන විත්තිකරුවන් විසින් එක්ව සහ / හෝ වෙන්ව පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්ද,

(*ආ*) ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡේදයේ අයැද ඇති රු. 180,000/- ක මුදලක් ද මත පැමිණිල්ලේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් නෛතික පොළියක් ද සමග අයකර ගැනීම සඳහා 1 වන හා 2 වන විත්තිකරුවන් විසින් එක්ව සහ හෝ වෙන් වෙන්ව පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ඕ) ඡේදයේ අයැද ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර ආයතනයට මෙම නඩුවේ තක්සේරු කරන ලද නඩු ගාස්තු ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ ඇති උකස් බැඳුම්කරයේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය ඉහත කී පැමිණිල්ලේ ආයාචනයේ (අ), (ආ) සහ (ඕ) අයැදීම්වල අයැද ඇති ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී ,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 09 දින ප. ව. 1.00 ට,** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අලුත්කුරු කෝරලේ දාසියා පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාවේ 130/1, වීදිය වත්ත බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ වීදියවත්ත පිහිටි තලගහවත්ත, කැටකැලගහවත්ත, රද්දොළුවේ දෙනිය සහ ගලාකුඹුර යන ඉඩමෙන් මැන අයි කොටඹගේ මානක තැන විසින් සාදන ලද අංක 3912 සහ 1999.11.20 දරන පිඹුරේ කැබලි අංක 22 යන කොටස සඳහා මායිම්,

උතුරට : කැබලි අංක 65 ලෙස වූ අඩි 15 ක් පළල පාර ද,
නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ කැබලි අංක 66 ද,
දකුණ : කැබලි අංක 23 ද,
බටහිරට : කැබලි අංක 21 සහ 24 ද යන මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් පහලොවක් (පර්. 15) විශාල ඉඩම සහ ඒ මත වූ ගහකොල, පලතුරු, ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 429/177 හි ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම :*

ගම්පහ නගරයේ සිට උඩුගම්පොල හරහා මිනුවන්ගොඩ පාර ඔස්සේ කිලෝමීටර් 5.6 ක් පමණ ගමන් කර වීදියවත්තට පැමිණ වීදියවත්ත හංදිය පසුකර මීටර් 450 ක් පමණ ගමන් කර කෙහෙල්බද්දරට මග පෙන්වන බුද්ධ ප්‍රතිමාව අසලින් ඇති තාර යෙදූ මෝටර් රථ ප්‍රවේශ විය හැකි වෙල පාරට වමට හැරී කිලෝමීටර් 1.1 ක් පමණ ගමන් කර දොලගත ප්‍රාදේශීය සභා පාරට මග පෙන්වන කොන්ක්‍රීට් යෙදූ මෝටර් රථ ප්‍රවේශ විය හැකි පටු පාරට වමට හැරී තවත් ඉදිරියට මීටර් 200 ක් පමණ ගමන් කළ විට වංගුවක දී දකුණේ පිහිටි විෂයගත ඉඩම වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුයි

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක ගාස්තුව ද, රු. 7500/- ඉක්මවන සෑම රු. 1,000/- ක් සඳහාම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 16 දින දී ය.

01-24

---

**ස්වකීය සිවිල් බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්,
ලියාපදිංචි කාර්යාලය,
අංක 245, 2 වන අදියර ධර්මපාල මාවත,
කොළඹ 07.

*සහ*

*ප්‍රධාන කාර්යාලය :*

අක 69, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.

*...............පැමිණිලිකරු.*

නඩු අංකය : CHC/638/15 MR
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 7,220,820.42/-
කාර්ය පටිපාටිය : සාමාන්‍යය
ඇස්කිසි අංකය : 48/2025

*එදිරිව*

(1) සෙල්ලප්පෙරුමගේ තිළිණි මංජුලා ප්‍රනාන්දු,
අංක 62/39, 3 වැනි පටුමග,
කොරළවැල්ල,
මොරටුව.

(2) යක්ගේ නිශාන් ප්‍රසංග මෙන්ඩිස්,
අංක 62/39, 3 වැනි පටුමග,
කොරළවැල්ල,
මොරටුව.

............*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවට වර්ෂ 2021 අගෝස්තු මස 02 දින ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව 1 සහ 2 විත්තිකරුවන් ක්‍රියාත්මක වීම පැහැර හැර හා අපොහොසත් වී ඇති බැවින්, සමථය ප්‍රකාරව 1 සහ 2 විත්තිකරුවන් ගෙවා ඇති රු. 475,000/- ක මුදල හා ඇස්කිසි ක්‍රියාත්මක කිරීමෙන් පසු 1 සහ 2 වන විත්තිකරුවන් ගෙවා ඇති රු. 3,350,000/- ක් අඩු කොට පැමිණිල්ලේ ආයාචනයේ සඳහන් ඉතිරි මුදල් අය කර ගැනීමට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත. ඒ අනුව එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය ප්‍රකාරව කොළඹ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 01 දින ලියා තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන නිශ්චල දේපළෙහි සියලුම අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 27 දින පෙ. ව. 10.30 ට,**

එම දේපළ පිහිටියා වූ අංක 62/39, 3 වැනි පටුමග, කොරළවැල්ල, මොරටුව යන ස්ථානයේ දී ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදලින් සියයට විසි පහක්වත් (25%) මෙම වෙන්දේසිය පැවැත්වීමෙන් පැය 48 ක් හෝ දින දෙකක් ඇතුළත ඔබ විසින් මෙම අධිකරණයේ ඉහත නඩුවේ ගිණුමට බැරව තැන්පත් කළ යුතු අතර ඉතිරි මුදල වන සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසියේ සිට ලිත් මසක් ඇතුළත මෙම අධිකරණයට ගෙවිය යුතුය. තව ද, ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ. පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු ද එකවරම මුදලින් මා වෙත ගෙවිය යුතු අතරම මෙම මුදල් කොළඹ බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ නඩු අංක CHC/638/2015/MR නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

*පිස්කල් ගාස්තු ගෙවීමේ ක්‍රමය.-* පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක මුදලක් ද ඉතිරි 7,500/- ක මුදල ඉක්මවන ලද මුදලින් සෑම රු. 1,000/- ක කොටසකටම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු ගෙවිය යුතුය.

එනම්,

පැමිණිල්ලේ ආයාචනයේ සඳහන් පරිදි,

(*අ*) 1 වන නඩු නිමිත්ත වන රු. 5,269,399/42 වන එකී මුදල ඒ මත 2015 සැප්තැම්බර් මස 25 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වසරකට 3% කට අනුපාතිකය බැගින් වැඩිපුර පොළිය ද, ඊට පසුව සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා එම අනුපාතිකය බැගින්ම තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදල මත පොළිය ද ව්‍යවස්ථාපිත අයකිරීම් සහ වෙනත් බැංකු ගාස්තු වෙනුවෙන් 1 වන සහ 2 වන විත්තිකරුවන්ට විරුද්ධව එක්ව හා / හෝ වෙන් වෙන්ව නඩු තීන්දුව දෙන ලෙසටත්,

(*ආ*) 2 වන නඩු නිමිත්ත වන රු. 1,951,421/- වන එකී මුදල ඒ මත 2015 සැප්තැම්බර් මස 25 දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වසරකට 3% කට අනුපාතිකය බැගින් වැඩිපුර පොළිය ද ඊට පසුව සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා එම අනුපාතිකය බැගින්ම තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදල මත පොළිය ද, ව්‍යවස්ථාපිත අයකිරීම් සහ වෙනත් බැංකු ගාස්තු වෙනුවෙන් 1 හා 2 වන විත්තිකරුවන්ට විරුද්ධව එක්ව හා / හෝ වෙන් වෙන්ව නඩු තීන්දුව දෙන ලෙසටත්,

(*ඇ*) නඩු ගාස්තු ලබා දෙන ලෙසටත්,

(ඈ) මෙහි උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති දේපළ සහ එයට, එයින් හෝ ඒ මත (මේ සියල්ල මෙහි පහත උකස් කළ දේපළ යනුවෙන් සමූහ වශයෙන් සඳහන් කරනු ලැබේ.) විත්තිකාරියට ඇති කුමන හෝ තත්වය, අයිතිවාසිකම්, හිමිකම්, සම්බන්ධතා, දේපළ, හිමිකම් ප්‍රකාශ සහ ඉල්ලීම් යන සියල්ල රු. 7,220,820.42 ක් වන එකී මුදල හා එකී වැඩිපුර පොළිය සහ ගාස්තු සමග ගෙවීම සඳහා 2012 ජූලි 23 දිනැති අංක 884 දරන "A" ලෙස ලකුණු කළ උකස්කරයේ පදනම මත විශේෂයෙන් හා මූලික වශයෙන් බැඳී ඇති හා ක්‍රියාත්මක කළ හැකිය යනුවෙන් ප්‍රකාශයෙන් ක්‍රියාත්මක කළ හැකි එකී උකස් කළ දේපළ මෙම අධිකරණය මගින් පත් කරන වරලත් වෙන්දේසිකරුවෙකු මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට හා එකී වෙන්දේසිකරුට පහත සඳහන් නියෝග කරන ලෙසටත්,

(I) උකස් කළ දේපළ විකිණීම පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* එක් වරක් සහ ඩේලි නිව්ස් පත්‍රයේ එක් වරක් අඩුම තරමින් විකිණීමට දින 20 කට පෙර දැන්වීම් පළකරන සහ වේලාවේ දී අඬබෙර ගැසීමෙන් දැන්වීමටත්,

(II) එකී දේපළ පළමුව තක්සේරු කළ වටිනාකම විකුණන ලෙසට ද, එම මුදල ලංසු තැබීමට කිසිවෙක් නැතිනම්, එවිට පැමිණිලිකරුගේ ඉල්ලීම, පොළිය සහ ගාස්තු යන සමස්ත මුදලට ද, මුදලටත් ලංසු තැබීමට කිසිවෙක් නැතිනම්, ඉනික්බිතිව ඊට පසු සිටින වැඩිම ලංසුකරුට විකුණන ලෙසට නියම කර බලය දීමටත්,

(ඉ) ගරු අධිකරණය විසින් යම් කොන්දේසි පනවනු ලබන්නේ නම්, එම කොන්දේසි මත අයදීම මත හා අන්‍යාකාරයෙන් එකී වෙන්දේසියේ දී උකස් කළ දේපළ ලංසු තැබීමට හා මිලට ගැනීමට පැමිණිලිකරුට හෝ එය වෙනුවෙන් වෙනත් කෙනෙකුට නියෝග කරන ලෙසටත්,

(ඊ) පහත සඳහන් කොන්දේසි ඉටු කිරීම මත එම වෙන්දේසියේ දී මිලට ගත් ගැනුම්කරුගේ හෝ ගැනුම්කරුවන්ගේ නමින් හිමිකරයක් ලියා අත්සන් කිරීමට එකී වෙන්දේසිකරුට හෝ ගරු අධිකරණය විධානය කිරීමට ඉඩ තිබෙන වෙනත් පුද්ගලයෙකුට නියෝග කරන ලෙසටත්,

(I) ගරු අධිකරණයෙන් විකිණීම ස්ථිර කිරීමේ නියෝගයක් ලබා ගැනීම මත
(II) විකිණීම පිළිබඳ කොන්දේසි ඉටු කිරීම මත

(උ) එකී දේපළ මිලට ගත් ගැනුම්කරු හෝ ගැනුම්කරුවන් එහි භුක්තියේ තබන ලෙසට කොළඹ වාණිජ මහාධිකරණයේ පිස්කල්ට නියෝග කරන ලෙසටත්,

(ඌ) විකිණීම පැවැත්වීම හෝ එහි කොන්දේසි සම්බන්ධව හෝ වෙනත් ආකාරයකින් හෝ පැමිණිලිකරුගේ උකස් අයිතිවාසිකම් බලාත්මක කිරීම සම්බන්ධව කලින් කලට එවැනි වෙනත් සහ වැඩිදුර නියමයන් දීමට ඇති සිය බලය ගරු අධිකරණය තමන් වෙත තබා ගන්නා ලෙසටත් නියෝගකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ මොරටු නගර සභා සීමාව තුළ කොරළවැල්ල යන ගම පිහිටි නව ගාළු පාරේ, වරිපනම් අංක 843/1 දරන අවසරලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. පී. එම්. ද සිල්වා මහතා මැන සාදන ලද අංක 1415 සහ 2003.07.03 සහ 19 යන දිනයන් හි දරන ප්ලෑනේ සඳහන් පයුරුගහවත්තේ කැබලි අංක "A" දරන කට්ටිය නමැති උතුරට : එෆ්. ලයනල් ප්‍රනාන්දුගේ දේපළ ද, නැගෙනහිරට : පී. යූ. සුසිලා ප්‍රනාන්දුට අයිති දේපළ ද, දකුණට : ඒ.කේ. නිමල් ද සිල්වාට සහ ඩබ්ලිව්. ජේ. එස්. ආර්. ප්‍රනාන්දුට අයත් දේපළ ද, බස්නාහිරට : නව ගාළු පාර ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් පහකුත් දශම හයයි හය (පර්. 5.66) ක් විශාලැති බිම සහ ඊට අයිති ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේ ද වේ. මෙය දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 11/104, D 11/141 දරන පත් ඉරුවේ සහ වෙළුමේ ලියාපදිංචි කර ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය - කොළඹ.

වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 15 දින දී ය.

01 - 28

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2026.01.02 | සිකුරාදා | 2025.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.09 | සිකුරාදා | 2025.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.16 | සිකුරාදා | 2026.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.23 | සිකුරාදා | 2026.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.30 | සිකුරාදා | 2026.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2026.02.06 | සිකුරාදා | 2026.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.13 | සිකුරාදා | 2026.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.20 | සිකුරාදා | 2026.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.27 | සිකුරාදා | 2026.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 03.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ.බ.)*

2026 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.